# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/8 - 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා - 2017.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන නිවේදනයයි

වයඹ පළාතේ ආණ්ඩුකාරවර අමරා පියසීලි රත්නායක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයේ 154ආ. වගන්තියේ (8)(ආ) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වයඹ පළාතේ හයවන පළාත් සභාවේ පළමු සැසි වාරය දෙදහස් දහතක් වූ දෙසැම්බර් මස අට වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට අවසන් කරන බව මෙයින් නිවේදනය කරමි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයේ 154ආ. වගන්තියේ (8)(ආ) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දෙදහස් දහඅටක් වූ ජනවාරි මස දහසය වැනි දින පෙරවරු 10.30ට කුරුණෑගල පළාත් සභා කාර්යාල සංකීර්ණයේ ''සශ්‍රී'' ශාලාවේ දී වයඹ පළාතේ හය වැනි පළාත් සභාවේ දෙවන සැසි වාරය කැඳවන බව ද මෙයින් නිවේදනය කරමි.

වර්ෂ දෙදහස් දහතක් වූ දෙසැම්බර් මස අට වැනි දින වූ මෙදින කුරුණෑගල දී ප්‍රකාශයට පත් කරන ලදී.

අමරා පියසීලි රත්නායක,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

12- 851